ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පවසන්නේ, දළ වශයෙන් ගත් විට ලෝකයේ ජනගහණයෙන් 15% ක් පමණ යම් ආකාරයක ආබාධයක් සහිතව ජීවත් වන බවයි. ඒ අනුව, ආබාධ සහිත අයවලුන් හටද කිසිත් වෙනසකින් තොරව, ලෝක ප්‍රජාවේ අය ලෙසින්ම සැලකුම් කිරීම අවශ්‍ය වේ. එහිදී ඔවුන්ව හඳුන්වන භාෂාවද වැදගත් තැනක් ගනී. යම් පුවතකට පුද්ගලයෙකුගේ ආබාධ සහිත බව ඍජුව අදාළ වන විටකදී, ඒ සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී වගකීම් සහගත සහ සහකම්පනය සහිත වන ලෙසින් මාධ්‍ය වෙත පැවසෙන්නේ ඒ හෙයිනි.

ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳව සඳහන් කිරීමේදී ආබාධය මුල් කොටගත් භාෂාවක් නොව, පුද්ගලයාව මුල් කොටගත් භාෂාවක් අවශ්‍ය බව මේ සම්බන්ධ ජාත්‍යන්තර මාර්ගෝපදේශයන් ඔස්සේ කතිකාවට ලක් කෙරෙනා කරුණකි. එය බැලූ බැල්මට භාෂාවේ සියුම් වෙනසක් පමණක් යැයි පෙනී ගියද, ආබාධ සහිතව ජීවත් වන්නෙකුට එම වෙනස ඉතාම වැදගත් වනු ඇත. පුද්ගලයාව මුල් කොටගත් භාෂාවකට උදාහරණ වන්නේ Disabled person වැනි යෙදුමක් වෙනුවට Person with a disability වැනි යෙදුමක් යොදාගැනීමයි. ඒ අනුව අපට 'ආබාධිත' යන්න වෙනුවට 'ආබාධ සහිත' වැනි යෙදුමක් යොදාගැනීමට හැක.

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

මූලාශ්‍ර:

https://www.who.int/.../world-report-on-disability...

http://www.disability.wa.gov.au/.../words_that_work_media...

https://adata.org/factsheet/ADANN-writing

#MediaEthicsSL #lka #SinhalaPress #Silumina #Lankadeepa